**සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය - 2016**
**------------------------------------------------------------**

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ. මේ පිළිබඳව විස්තරාත්මක වාර්තාවක් සමාගමේ සභාපති වෙත 2017 ජූනි 29 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 සමාගම පිහිටුවීම හා අයිතිය**

1979 අප්‍රේල් 13 වන දින පෞද්ගලික සමාගමක් ලෙස ආරම්භ කර තිබුණු මෙම සමාගම 1971 අංක 35 දරන ව්‍යාපාර අත්පත් කර ගැනීමේ පනත යටතේ 1979 ජූනි 05 දිනැති අංක 39/04 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් රජයට පවරා ගෙන තිබුණි. එමෙන්ම එය රජයට අයත් ව්‍යාපාර, පොදු සමාගම් බවට පත් කිරීමේ 1987 අංක 23 දරන සමාගම් පනත හා 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති අතර මුළුමනින්ම රජයට අයත් සමාගමක් ලෙස සම්පූර්ණ කොටස් හිමිකාරීත්වය මහා භාණ්ඩාගාරය සතුව පැවතුණි.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 32 වගන්තිය අනුව, අස්තිත්වය විසින් ප්‍රමිතියක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හෝ ආදායම් සහ වියදම් හිලව් නොකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී රු.175,052 ක අඩමාන ණය අධිවෙන්කිරීමක් වියදමට හිලව් කරමින් ගිණුම්ගත කර තිබුණි. එසේම වර්ෂය තුළදී ගෙවන ලද ආර්ථික සේවා ගාස්තුව වූ රු.2,141,466 ක් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන යා හැකි බද්දක් ලෙස ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කරනු වෙනුවට ගෙවිය යුතු නීතිමය වියදම් ලෙස ජංගම බැරකම්වලට හිලව් කර දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

ප්‍රමිතයේ 51 වගන්තිය අනුව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.877,760,119 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

-------------------------------------

ප්‍රමිතයේ 57(ඩී) වගන්තිය අනුව, පාරිතෝෂිත ආයුගණක ලාභ හෝ පාඩු, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ ගිණුම්ගත කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ රු.7,292,562 ක් වූ ආයුගණක පාඩුව වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

**2.2.2 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති**

**-------------------------------------------**

ප්‍රමිත 07 හි 31 හා 33 වගන්ති අනුව, මූල්‍ය සාධන පත්‍රවලින් පැනනගින අවදානම් ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට ඇගයීම් පහසුව සඳහා අවශ්‍ය තොරතුරු ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කළ යුතු වුවද, සමාගම විසින් පොලී අනුපාත අවදානම පිළිබඳ තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රදාන වලින් මිලදී ගන්නා දේපල, පිරියත හා උපකරණ ක්‍රමක්ෂය කිරීම එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය තුළදී සිදුකරන බවට ගිණුම් ප්‍රතිපත්තියක් මගින් හඳුනාගෙන තිබුණි. ඒ අනුව, 2008 වර්ෂයේදී රජයේ ප්‍රදානවලින් මිලදී ගෙන තිබූ රු.31,221,094 ක් වූ වත්කම් වර්ෂ 08 ක් තුළදී වාර්ෂිකව රු.3,902,637 ක් බැගින් ක්‍රමක්ෂය කළ යුතු විය. එහෙත් සමාගම විසින් 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ක්‍රමක්ෂය කර තිබුණේ රු.26,753,353 ක් පමණක් වූයෙන් ඉකුත් වර්ෂයට අදාළ ක්‍රමක්ෂය රු.3,829,492 ක් හා සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රමක්ෂය රු.638,249 ක් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. තවද සාවද්‍ය ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රාජ්‍ය ප්‍රදාන ශේෂය රු.5,615,264 කින් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ මෝටර් රථ ක්ෂය වටිනාකම රු.4,847,767 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණ අතර ඒ හේතුවෙන් එම වත්කම් වටිනාකම ද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාගමේ ගොඩනැගිලි සහ වෙනත් වත්කම් ක්ෂය පිළිවෙලින් රු.10,476 ක් සහ රු.467,423 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු අතර යන්ත්‍ර සූත්‍ර හා උපකරණවල ක්ෂය රු.477,899 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් එම වත්කම්වල වටිනාකම් එම ප්‍රමාණයන්ගෙන් පිළිවෙලින් අඩුවෙන් සහ වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම රු.6,504,858 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.9,586,890 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ගෙවිය යුතු එකතු කළ අගය මත බදු රු.3,082,032 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට අදාළව ගෙවිය යුතු රු.24,142,870 ක් වූ විකුණුම් කොමිස් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාගමේ ආර්ථික සේවා ගාස්තු වාර්තාව අනුව, වර්ෂයේ පළමු සහ අවසාන කාර්තුව සඳහා ආර්ථික සේවා ගාස්තුව වන රු.3,482,138 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා නොතිබුණු අතර ඒ සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලස්වා නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී පොත් වවුචර්, තැගි වවුචර් හා වසර මැද ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණු එකතුව රු.15,443,220 ක් වූ ප්‍රසාද දීමනා ගිණුමට හර කිරීම වෙනුවට සේවක සුබසාධන ගිණුමට සහ කාර්ය සාධන දීමනා ගිණුමට හර කර තිබුණි.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

-----------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සමාලෝචිත වර්ෂයේ බද්දට යටත් ආදායම රු.1,829,879,669 ක් වුවද එකතු කළ අගය මත බදු වාර්තාව පිළියෙල කිරීම සඳහා එම ආදායම රු.1,852,030,397 ක් ලෙස සැලකීම හේතුවෙන් රු.22,150,728 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේම, ජාතිය ගොඩ නැගීමේ බදු වාර්තාව පිළියෙල කිරීම සඳහා ආදායම රු.1,824,866,850 ලෙස සැලකීම නිසා මූල්‍ය ප්‍රකාශන අනුව බද්දට යටත් ආදායම සහ ජාතිය ගොඩ නැගීමේ බදු වාර්තාවේ ආදායම අතර රු.5,012,819 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

---------------------------------------------

(අ) පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විස්තරය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (i) | සේවාදායක ණයගැතියෝ | 786,464,300 | විස්තරාත්මක වයස් විශ්ලේෂණය සහිත ණයගැති උපලේඛනය |
| (ii) | වෙනත් ණයගැතියෝ | 15,674,565 | |
| (iii) | පුස්තකාල පොත් | - | කැසට්පට හා පුස්තකාල පොත් ආපසු භාර නොදුන් පුද්ගලයින්ගේ නාම ලේඛනය |

(ආ) 2016 වර්ෂයේදී ගාස්තු අය කිරීමෙන් තොරව විකාශය කරන ලද වැඩ සටහන් පිළිබඳ තොරතුරු සහ මිල දී ගන්නා ලද විදේශීය වැඩසටහන්, නාට්‍ය සහ චිත්‍රපට පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

**2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට අගරු චෙක්පත් වටිනාකම රු.16,163,159 ක් වූ අතර එම වටිනාකම තුළ 2008 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාළ වටිනාකම රු.8,494,552 ක් විය. මෙම වටිනාකමෙන් රු.3,000,000 ක් සහ රු.2,702,500 ක් අවස්ථා කිහිපයකදී ගනුදෙනුකරුවන් දෙදෙනෙකුගෙන් ලද චෙක්පත් අගරු වීම් බව, නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අගරු චෙක්පත් වටිනාකමෙන් රු.7,275,778 ක් සඳහා හානිකරණ ගැලපීම් සිදු කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට 2004 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතුන ප්‍රතිවෙළඳ ණය ගැති ශේෂය රු.14,641,729 ක් වූ අතර එකඟ වූ පරිදි සේවාවන් ලබා ගැනීමට සමාගම විසින් කටයුතු කිරීමකින් තොරව එම සම්පූර්ණ ශේෂය සඳහා හානිකරණ ගැලපීම් සිදුකර තිබුණි.

(ඈ) සමාගමේ සේවාදායකයන්ට ණය දීමේ ප්‍රතිපත්තිය අනුව මාස 03 ක කාලයක් තුළදී ණය අයකර ගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අයවිය යුතුව පැවති රු.786,464,300 ක් වූ සේවාදායක ණය ගැතියන්ගෙන් මාස 03 ත් මාස 06 ත් අතර ශේෂ එකතුව රු.137,954,614 ක්ද, මාස 06 ට වැඩි වර්ෂයට අඩු ශේෂ එකතුව රු.89,543,433 ක්ද, වර්ෂයට වඩා වැඩි ණයගැති ශේෂ එකතුව රු.200,782,625 ක් ද විය. ඒ අනුව මුළු ණයගැති ශේෂයෙන් සියයට 54 ක් මාස 03 ඉක්මවා තිබූ අතර සියයට 19 ක් හෙවත් රු.149,258,497 ක ශේෂ සඳහා හානිකරණ ගැලපීම් සිදුකර තිබුණි.

(ඇ) සමාගම විසින් 2010 වර්ෂයේදී ජනමාධ්‍ය අමාත්‍යාංශයට ලබාදෙන ලද රූපවාහිනී යන්ත්‍ර 03 ක් වෙනුවෙන් ලැබිය යුතු රු.269,973 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුම ලැබී නොතිබුණි. එසේම, 2009 වර්ෂයේදී සමාගමේ නිලධාරීන් සිව් දෙනෙකු වෙනුවෙන් ගෙවන ලද රු.35,942 ක් වූ පෞද්ගලික දුරකථන බිල්පත් ගාස්තු සමාලෝචිත වර්ෂය වන විටද ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ඉ) සමාගම විසින් ආපසු ගෙවිය යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුද මුදල් රෙගුලාසි 571 ට අනුකූලව කටයුතු නොකළ කල් ඉකුත් වූ තැන්පතු වටිනාකම රු.859,275 ක් විය.

(ඊ) ගනුදෙනුකරුවන් වෙත නිකුත් කිරීම සඳහා 2012 වර්ෂයේ සිට ලියන ලද නමුත් නිකුත් නොකරන ලද රු.4,957,007 ක් වටිනා චෙක්පත් 645 ක් අවලංගු කර එම වටිනාකම සමාලෝචිත වර්ෂයේදී වෙනත් ගෙවිය යුතු දෑ යටතේ අවලංගු කළ චෙක්පත් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. මෙම මුදල්වලට අදාළ පාර්ශවයන් විසින් හිමිකම් නොපා සිටීම අසාමාන්‍ය කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ.

(උ) 2016 වර්ෂයේදී සේවාවන් කිහිපයක් ලබා ගැනීම සඳහා පෞද්ගලික ගනුදෙනුකරුවන්ට රු.7,441,948 ක අත්තිකාරම් මුදල් ගෙවා තිබුණු නමුත් 2017 මැයි මාසය වන තුරුම එම සේවාවන් ලබා ගෙන නොතිබුණු අතර අත්තිකාරම් මුදල් නිරවුල් කර ගැනීමටද පියවර ගෙන නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 757 | වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණ සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2017 මැයි 26 දින වන තුරුද භාණ්ඩ සමීක්ෂණය අවසන් කර නොතිබුණි. |
| (ආ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | |
| (i) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 දරන චක්‍රලේඛය. | ප්‍රවාහන හා ඉන්ධන දීමනා සඳහා හිමිකම් නොමැති නිලධාරීන් 300 දෙනෙකු වෙත ප්‍රවාහන හා ඉන්ධන දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.18,681,366 ක් ගෙවා තිබුණි.<br><br>තවද සමාගමේ හිටපු සභාපතිවරයා සහ වර්තමාන සභාපතිවරයා විසින් චක්‍රලේඛ සීමාවන් ඉක්මවා රු.222,976 ක් වටිනා ඉන්ධන ලීටර් 1,762 ක් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව ලබා ගෙන තිබුණි. |

(ii) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛය

- 8.2.2 වගන්තිය

2016 දෙසැම්බර් 31 දිනට රු.1,589,314,674 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම සඳහා මුදල් ඇමතිවරයාගේ එකඟත්වය සහ අදාළ ඇමතිවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

- 9.3 වගන්තිය

කාර්ය මණ්ඩලයේ සෑම තනතුරක් සඳහාම ඉතා පැහැදිලිව හා විස්තරාත්මකව පිළියෙල කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් තිබිය යුතු වුවත් සමාගමට එවැන්නක් නොතිබුණි.

(iii) 2016 දෙසැම්බර් 16 දිනැති අංක පීඊඩී 05/2016 දරන චක්‍රලේඛය

2016 වර්ෂය තුළදී පහත දැක්වෙන පරිදි ආයතනය විසින් සේවකයන්ට ප්‍රසාද දීමනා ගෙවා තිබුණි.

| | ස්වාධීන රුපවාහිනී සේවය | වසන්තම් ටීවී | අයිටීඑන් එෆ්එම් | වසන්තම් එෆ්එම් | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| වසර මැද ප්‍රසාද දීමනාව රු.7,500 බැගින් | 4,007,680 | 177,620 | 519,373 | 105,000 | 4,809,673 |
| වසර මැද සහ වසර අග පොත් වවුචර් දීමනාව රු.2,000 බැගින් | 2,424,000 | 40,000 | 194,000 | 34,000 | 2,692,000 |
| කාගිල්ස් ෆුඩ්සිටි තෑගි වවුචර් දීමනාව රු.5,000 බැගින් | 7,314,000 | 214,000 | 1,018,000 | 203,000 | 8,749,000 |
| වසර අවසාන ප්‍රසාද දීමනාව | 12,384,195 | 394,407 | 1,452,417 | 259,275 | 14,490,294 |
| එකතුව | | | | | 30,740,967 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- සමාගම විසින් 2015 වර්ෂයේදී රු.433,021,231 ක ලාභයක් ලබා තිබුණු අතර 2016 වර්ෂයේදී රු.107,189,266 ක අලාභයක් ලබා තිබුණි. එම නිසා චක්‍රලේඛ උපදෙස් පරිදි එක් සේවකයෙකුට ගෙවිය හැක්කේ රු.2,000 ක ප්‍රසාද දීමනාවක් පමණක් වුවත් ඉහත දැක්වෙන පරිදි චක්‍රලේඛ උපදෙස්වලට පටහැනි ලෙස එක් සේවකයෙකුට රු.61,000 ක් බැගින් වන සේ එකතුව රු.30,740,967 ක් ප්‍රසාද දීමනා වශයෙන් ගෙවා තිබුණි.

- චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව අදාළ මුදල් වර්ෂය තුළ අලාභදායී තත්ත්වයක් වාර්තා කර ඇති රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා ගෙවීමට ප්‍රථමයෙන් මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගත යුතු වන අතර ඒ සඳහා වන ඉල්ලීම අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය සමග ඉදිරිපත් කළ යුතුය. එසේ වුවත් ඉහත පරිදි ප්‍රසාද දීමනා ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයේ එකඟතාව ලබා ගෙන නොතිබුණි.

චක්‍රලේඛයේ 3.3 ඡේදයේ උපදෙස් ප්‍රකාරව, ප්‍රසාද දීමනා ගෙවීම සඳහා සමාගමේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 සමග නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන්හි යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.5 ඡේදයේ විධිවිධානයන් ප්‍රකාරව නියමිත දිනට හෝ ඊට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබිය යුතුය. එසේ වුවත් 2015 සහ 2016 වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණේ පිළිවෙලින් 2016 මැයි 26 සහ 2017 අප්‍රේල් 06 යන දිනයන්හිදීය.

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ අලාභය රු.107,189,266 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.433,021,231 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.540,210,497 කින් හෙවත් සියයට 125 කින් පිරිහී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ගුවන් කාල විකුණුම් ආදායම රු.656,657,443 කින් හෙවත් සියයට 27 කින් අඩු වීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------

සමාගම යටතේ පවතින ස්වාධීන රූපවාහිනී සේවයේ 2015 වර්ෂයේදී රු.526,902,334 ක ලාභයක් ලබා තිබුණු නමුත් 2016 වර්ෂයේදී එය රු.8,618,025 ක අලාභයක් දක්වා එනම් ලාභය රු.535,520,359 කින් හෙවත් සියයට 102 කින් අඩු වී තිබුණි. වසන්තම් ටීවී හි 2015 වර්ෂයේදී ලද රු.8,932,290 ක් වූ අලාභය 2016 වර්ෂයේදී රු.26,430,929 දක්වා එනම් රු.17,498,639 කින් හෙවත් සියයට 196 කින් වැඩි වී තිබුණි. වසන්තම් එෆ්එම් සහ අයිටීඑන් එෆ්එම් ගුවන් විදුලියේ 2015 සහ 2016 යන වර්ෂ දෙකෙහිම අලාභයන් ලබා තිබුණු නමුත් එම අලාභයන් පිළිවෙලින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.7,254,218 කින් සහ රු.5,554,284 කින් හෙවත් සියයට 45 කින් සහ සියයට 8 කින් අඩු වී තිබුණි.

## 3.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ ලාභදායී අනුපාත සහ කාරක ප්‍රාග්ධන අනුපාත පහත දැක්වේ.

| අනුපාතය | 2016 | 2015 |
| --- | --- | --- |
| දළ ලාභ අනුපාතය (සියයට) | 65 | 77 |
| ශුද්ධ ලාභ/(අලාභ) අනුපාතය (සියයට) | (4) | 18 |
| ජංගම අනුපාතය | 3.97 | 3.67 |
| ක්ෂණික අනුපාතය | 4 | 3.63 |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට, සමාගමේ ප්‍රවෘත්ති විකාශය තුළදී සිදු වූ අපහාස කිරීම් වෙනුවෙන් නඩු 04 ක් ද හිමිකරුවන්ගේ චිත්‍රපට අවසරයකින් තොරව විකාශය කිරීම හේතුවෙන් නඩු 04 ක්ද වශයෙන් බාහිර පාර්ශවයන් විසින් සමාගමට එරෙහිව නඩු 08 ක් පවරා තිබූ අතර එයින් නඩු 06 ක් සඳහා පැමිණිලි පාර්ශවය විසින් ඉල්ලා තිබුණු වන්දි මුදල රු.2,560,225,000 ක් විය. එසේම, වැඩ තහනම් කරන ලද සේවකයෙකු විසින් එක නඩුවක් පවරා තිබුණු අතර නඩු සඳහා නීතිඥ ගාස්තු වශයෙන් රු.920,085 ක් ගෙවා තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දින වන විට සමාගම විසින් ලබා දී තිබුණු ගුවන් කාලය වෙනුවෙන් අය විය යුතු රු.16,752,166 ක් අය කර ගැනීම සඳහා ණයගැතියන්ට එරෙහිව නඩු 09 ක් පවරා තිබුණු අතර එයින් රු.4,285,977 ක් අය විය යුතු ණයගැතියන් දෙදෙනෙකුගේ ස්ථිර පදිංචි ස්ථානයන් සොයා ගත නොහැකි වීම නිසා එම නඩු ඉදිරියට පවත්වා ගෙන යාමට නොහැකි වී තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට වසර දෙකකට වැඩි කාලයක් පවතින ණයගැති ශේෂය රු.134,807,643 ක් වුවත් මුදල් අය කර ගැනීම සඳහා නඩු පවරා තිබුණේ රු.16,752,166 ක් වෙනුවෙන් පමණි.

### 4.2 හඳුනාගත් පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ හිටපු සේවකයෙකු විසින් 2011 වර්ෂයේදී වංචා කරන ලද මුදලකින් තවදුරටත් ලැබිය යුතු වටිනාකම රු.1,210,620 ක් වූ අතර මේ සම්බන්ධයෙන් ගන්නා ලද අධිකරණමය ක්‍රියා මාර්ගයේදී ඒ සඳහා රීට් ආඥාවක් නිකුත් කරන ලද නමුත් එය භාර දීම සඳහා ඔහුගේ ලිපිනය සොයා ගැනීමට නොහැකි වී තිබුණි. එම සම්පූර්ණ වටිනාකම සඳහා හානිකරන ගැලපීම් සිදුකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ස්වාධීන රූපවාහිනී සේවය විසින් විකාශය කරන ලද දේශීය ටෙලි නාට්‍ය 13 කින් රු.50,173,801 ක අලාභයක් දැරීමට සිදු වී තිබුණි.

(ඇ) ටෙලි නාට්‍ය මිලදී ගැනීමේදී අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පත් කරනු ලබන ස්වාධීන කමිටුවක් මගින් එම නාට්‍යයේ අන්තර්ගතය හා එහි ගුණාත්මකභාවය පිළිබඳව අධ්‍යයනයකින් පසු පූර්ව ඇගයීමකට ලක්කර එය විකාශයට සුදුසුද, නැද්ද යන්න නිර්දේශ කළ යුතු විය. එහෙත් 2016 වර්ෂයේදී එවැනි පූර්ව ඇගයීමක් සිදු නොකර සමාගමේ වැඩසටහන් නිෂ්පාදිකාවකගේ නිර්දේශය මත කථාංග 154 කින් සමන්විත "රාවනා" නැමැති ඉන්දීය ටෙලිනාට්‍ය මිලදී ගෙන තිබුණි. එම නාට්‍ය කොටස් 61 ක් විකාශය වීමෙන් පසුව කරන ලද අභ්‍යන්තර පරීක්ෂණයකදී එම කොටස් 61 විකාශය සඳහා නාට්‍ය මිල දී ගැනීම, හඬ කැවීමේ වියදම, ආනයනික බදු සහ ගුවන් කාල පිරිවැය වශයෙන් එකතුව රු.22,330,935 ක් වැය කර තිබුණි. එහෙත් ඒ සඳහා ආදායම් වශයෙන් ලැබී තිබුණේ රු.850,000 ක් පමණක් වූයෙන් රු.21,480,935 ක පාඩුවක් දැරීමට සිදු වී තිබූ අතර ඒ අනුව ඉතිරි කොටස් විකාශය කිරීම අත්හිටුවා තිබුණි. නමුත්, නාට්‍යයට ගෙවිය යුතු සම්පූර්ණ මුදල ඉන්දීය සමාගමට නොගෙවුවහොත් නීතිමය ක්‍රියාමාර්ගවලට යොමු වීමට සිදුවන බැවින් එයින් වැළකීම සඳහා විකාශය නොකරන ලද කථාංග 93 වෙනුවෙන් ඉන්දීය සමාගමට ගෙවන ලද රු.6,143,423 ක් ද ඉහත පිරිවැයට ඇතුළත්ව තිබුණි.

**4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------

2010 අගෝස්තු සිට 2014 ජූලි මාසය දක්වා සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරන ලද නිලධාරියා විසින් මාසික ප්‍රවාහන දීමනා ලෙස රු.40,000 ක් බැගින් සහ ඉන්ධන ලීටර් 140 ක් සඳහා ඉන්ධන දීමනාව ලබා ගනිමින් සමාගමේ වාහනද පරිහරණය කර තිබුණු අතර එසේ භාවිතා කරන ලද කිලෝ මීටර් 46,237 ක් සඳහා අය විය යුතු රු.755,950 ක් අය කරගෙන නොතිබුණි.

**4.4 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

-----------------------

සමාගම අලාභදායී තත්ත්වයක් කරා ගමන් කරමින් සිටියදී සමාලෝචිත වර්ෂය තුළදී කාර්ය මණ්ඩලයට දිරි දීමනා, කාර්යසාධන දිරි දීමනා, ප්‍රසාද දීමනා සහ කාර්ය මණ්ඩල සුබසාධන දීමනා ආදී වශයෙන් එකතුව රු.115,599,550 ක දීමනා ගෙවා තිබුණි.

**4.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

සමාගමට අයත්, පිරිවැය රු.15,093,025 ක් වූ මෝටර් රථ 11 කින් වාහන 03 ක් 2014 වර්ෂයේ සිටද, වාහන 05 ක් 2015 වර්ෂයේ සිටද වාහන 02 ක් 2016 ජනවාරි සිට සහ තවත් වාහනයක් 2016 මැයි මාසයෙන් පසුවද, ධාවනය සඳහා යොදාගෙන නොතිබුණි. මේ අතුරින් වාහන 02 ක් අපහරණය කිරීම සඳහා කටයුතු කරන ලද නමුත් පළමු වැඩිම මිල ඉදිරිපත් කළ ගැනුම්කරු මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව දෙවන වැඩිම මිල ඉදිරිපත් කළ ගැනුම්කරුට වාහන මිලදී ගන්නා ලෙස සමාගම විසින් දැනුම් නොදීම නිසා මේ වන තුරුම අභාවිත වාහනයක් ලෙස පැවතුණි.

**4.6 මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුම සමාගමේ සේවක සංඛ්‍යාව මහා භාණ්ඩාගාරය වෙතින් අනුමත කරවාගෙන නොතිබුණි.

(ආ) 2005 ජුනි 16 දිනැති අමප/05/විවිධ (026) දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, උපදේශකවරුන් පත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමේදී නම් කරනු ලබන්නාගේ ජීව දත්ත තොරතුරු, ඔහුට පැවරීමට නියමිත කාර්යභාරය, සහ කාල වකවානුව සමග සංදේශයක් ඉදිරිපත් කොට අමාත්‍ය අනුකාරක සභාවේ නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩල අනුමැතිය

ලබාගත යුතුය. එසේ වුවත් 2015 සහ 2016 වර්ෂයන්හිදී උපදේශකවරුන් 07 දෙනකු එසේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමකින් තොරව බඳවාගෙන මාසික දීමනා, වාහන හා ඉන්ධන දීමනා වශයෙන් එකතුව රු.6,713,933 ක් ගෙවා තිබුණු අතර ඉන් උපදේශකයන් දෙදෙනෙකු සඳහා 2016 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා වූ මාස 05 ක කාලය තුළදී ඉන්ධන ලීටර් 2910 ක් වෙනුවෙන් රු.325,916 ක් වැය කර තිබුණි.

සමාලෝචිත වර්ෂයේ දී එක් උපදේශකවරයෙකු ඉවත් වී යන අවස්ථාවේ ඔහුට ආයතනයෙන් ලබා දෙන ලද ඇපල් වර්ගයේ දුරකථනය හා රූපවාහිනී යන්ත්‍රය ආපසු ලබා ගෙන නොතිබුණි. තවද, එම නිලධාරියාගේ පෞද්ගලික දුරකථන බිල්පත් පියවීම සඳහා රු.77,669 ක්ද, සමාගම විසින් වැයකර තිබුණු අතර එයද නිලධාරියාගෙන් අය කර ගෙන නොතිබුණි.

(ඇ) ආයතනයේ කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමකින් සහ භාණ්ඩාගාර අනුමැතියකින් තොරව, සමාගමේ වැඩබලන සභාපතිවරයාගේ 2016 ජූලි 04 දිනැති අංක අයිටීඑන්/පීඑෆ් දරන පත්වීම් ලිපිය මගින් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී තනතුරට නිලධාරියෙකු පත් කර මාසික දීමනා, සංග්‍රහ දීමනා, ජීවන වියදම් දීමනා සහ ඉන්ධන දීමනා ලෙස රු.919,355 ක් නීත්‍යානුකූල නොවන ලෙස ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) භාණ්ඩාගාර ලේකම්වරයා විසින් 2015 ජනවාරි 21 දිනැති ලිපියක් මගින් සමාගම් ව්‍යවස්ථාවලියේ 78 වගන්තියට අනුකූලව යැයි සඳහන් කරමින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු මෙන්ම ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු වශයෙන් නිලධාරියෙකු පත් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සාංගමික ව්‍යවස්ථාවලියේ 78 වන වගන්තිය මගින් භාණ්ඩාගාර ලේකම්වරයාට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් පත් කිරීම සඳහා පමණක් බලය පැවරී තිබුණ ද ඊට පටහැනි ලෙස මෙම පත් කිරීම සිදු කර තිබුණි.

(ii) සමාගම සඳහා සේවක සංඛ්‍යාවක් අනුමත කර නොමැති අතර භාණ්ඩාගාර අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා සකස් කර ඇති කාර්ය මණ්ඩල ලේඛනය තුළද ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරක් ඇතුළත් කර නොතිබුණි. එසේ වුවත් ඔහුට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කරනු ලබන ගෙවීම්වලට අමතරව සමාලෝචිත වර්ෂය තුළදී මාසික දීමනාව වශයෙන් රු.900,000 ක් සහ ඉන්ධන සඳහා රු.265,164 ක් වැය කර තිබුණි. එසේම ඔහුගේ භාවිතය සඳහා සමාගමේ වාහනයක් ද වෙන් කර දී තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එය ඉදිරිපත් කර තිබුණේ 2017 අප්‍රේල් 06 දිනදීය.

### 5.2 සංයුක්ත සැලැස්ම

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වගන්තිය ප්‍රකාරව 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලයට සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණ ද 2016 වර්ෂය සඳහා යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව සමාගම විසින් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද සමාගමට තිබෙන සම්පත්, සමාගමේ සංවිධාන සැලැස්ම, පූර්ව වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය ආදී තොරතුරු එයට ඇතුළත් කර නොතිබුණි.

## 5.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනා ගන්නා ලද කාර්යයන් එම සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. එසේම ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරන ලද සමහර ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.

## 5.4 වෙළඳපොල කොටස (Market Share)

ප්‍රේක්ෂකයින් රූපවාහිනිය නැරඹීම සහ ගුවන් විදුලියට සවන් දීම පිළිබඳව "සීමාසහිත ලංකා වෙළඳපොල පර්යේෂණ කාර්යාංශය" (Lanka Market Research Bureau – LMRB) විසින් රූපවාහිනී නාලිකා 15 ක් සම්බන්ධයෙන් සිදු කරන ලද සමීක්ෂණයට අනුව 2015 වර්ෂයේදී ස්වාධීන රූපවාහිනී සේවය සඳහා සියයට 14.4 ක්ව පැවති කොටස සමාලෝචිත වර්ෂය අවසාන වන විට සියයට 8.44 දක්වා පහත බැස තිබුණි. 2016 වර්ෂයේදී ලක්හඬ ගුවන් විදුලියේ නම අයිටීඑන් එෆ්එම් වශයෙන් වෙනස් කිරීම සඳහා දැන්වීම් මුද්‍රණය කිරීම වෙනුවෙන් රු.1,350,990 ක්ද, දැන්වීම් ප්‍රචාරක නියෝජිතවරුන් වෙනුවෙන් පැවැත්වූ කොක්ටේල් සාදයක් සඳහා රු.1,646,000 ක් ද වශයෙන් එකතුව රු.2,996,990 ක් ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් දරා තිබුණු නමුත් වෙළඳපල කොටස වැඩි කර ගැනීමට නොහැකි වී තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු ගිණුම් | (i) | අගරු චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකිරීම. |
| | | (ii) | සේවාදායක ණය අයකර ගැනීම ප්‍රමාද වීම. |
| | | (iii) | ණය කාල සීමාව ඉක්මවා සේවාදායක ණය ලබා දීම. |
| | | (iv) | ප්‍රතිවෙළඳ ගනුදෙනු සඳහා එකඟ වූ සේවාවන් ලබා නොගැනීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | (i) | කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීම් පටිපාටියක් නොමැති වීම. |
| | | (ii) | සේවක සංඛ්‍යාව භාණ්ඩාගාරය වෙතින් අනුමත කර ගෙන නොතිබීම. |